**ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් - 2016**

---

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ ගිණුම, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය කරගෙන යාම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක් ද මට සහය විය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 5.1.2 වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දී කාර්යසාධන දර්ශකයන් හඳුන්වා දී කාර්යසාධනය ඇගයීමට ලක්කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) 5.2.5. වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ අයවැය ලේඛනය ඉදිරි වර්ෂය එළඹීමට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය හා විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත්, සමාගම විසින් 2016 වර්ෂය සඳහා සකස් කළ අයවැය ලේඛනය සඳහා ඉහත අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. |
| (iii) 7.2 වගන්තිය | ආයතනයේ සියලු ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොතක් (Procedure Manual /System ) පිළියෙල කර නොතිබුණි. |
| (iv) 9.3.1 වගන්තිය | 2016 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් 91 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා තිබුණ ද බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (v) 9.12 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණු සුභසාධන යෝජනා ක්‍රම 4 ක් සඳහා රු.1,604,731 ක් වැයකර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 77.6 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 36.8 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 40.8 ක එනම් සියයට 111 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව තෙල් මෙහෙයුම් කටයුතු ආදායම් රු.මිලියන 34 කින් ඉහලයාම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේ රු. 81,119,462 ක් ව පැවති ලාභය ඉන් පසු වර්ෂවලදී උච්ඡාවචනය වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.77,651,525 ක් වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේ දී 2012 වර්ෂයේ රු. 214,506,082 ක් ව පැවති ආයතනයේ දායකත්වය උච්ඡාවචනයන්ට ලක් වී තිබු අතර 2016 වර්ෂය අවසානයට එය රු.199,852,023 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සාංගමික සංස්ථාපත්‍රය අනුව, වරාය අධිකාරියේ විෂය භාර අමාත්‍යවරයා විසින් වරාය අධිකාරිය වෙත ලබා දෙන උපදෙස් අනුව, වරාය අධිකාරිය විසින් සමාගම වෙත කලින් කලට පවරනු ලබන කර්තව්‍යයන් හා නියමයන් පරිදි, කොළඹ වරාය වෙත නැව්තෙල් සැපයීම හා කළමනාකාරීත්වය පවත්වාගෙන යාම ආයතනයේ ප්‍රධාන අරමුණ වේ.

ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් කාර්යය වර්ග තුනකට අයත් නැව්තෙල් පැටවීම, රඳවා තබා ගැනීම හා ගොඩබෑම වන අතර එයට අදාළ සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ තුනක තොරතුරු පහත පරිදි විය.

<u>ඒකක මෙට්‍රික් ටොන්</u>

| තෙල් වර්ගය | 2016 | | 2015 | | 2014 | | 2013 | |
|---|---|---|---|---|---|---|---|---|
| | පැටවීම් | ගොඩබෑම් | පැටවීම් | ගොඩබෑම් | පැටවීම් | ගොඩබෑම් | පැටවීම් | ගොඩබෑම් |
| අයිඑෆ්ඕ 180 | 26,610 | 26,513 | 38,172 | 36,377 | 46,083 | 48,131 | 31,817 | 31,147 |
| එච්එෆ්ඕ 380 | 378,300 | 386,345 | 347,143 | 338,750 | 226,153 | 243,460 | 185,377 | 179,001 |
| එම්ජීඕ | 56,522 | 57,523 | 50,714 | 50,274 | 61,402 | 61,997 | 54,450 | 44,975 |
| **එකතුව** | **461,432** | **470,381** | **436,029** | **425,401** | **333,638** | **353,588** | **271,644** | **255,123** |
| වර්ධනය ඒකක | 25,403 | 44,980 | 102,391 | 71,813 | 61,994 | 98,465 | -- | -- |
| ප්‍රතිශතය | 6 | 11 | 31 | 20 | 23 | 39 | -- | -- |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 වර්ෂයට සාපේක්ෂව අයිඑෆ්ඕ (IFO) 180 වර්ගයේ තෙල් පැටවුම් (Lording) සියයට 30 කින් අඩු වී තිබූ අතර නාවික ගෑස් තෙල් (MGO) වර්ගයේ හා එච්එෆ්ඕ (HFO) 380 වර්ගයේ තෙල් පිළිවෙලින් සියයට 11 කින් හා සියයට 9 කින් වැඩි වී තිබුණි.

(ii) 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ දී අයිඑෆ්ඕ (IFO) 180 වර්ගයේ තෙල් ගොඩබෑම් (Unloading) සියයට 27 කින් අඩු වී තිබූ නමුත් නාවික ගෑස් තෙල් (MGO) වර්ගයේ තෙල් හා එච්එෆ්ඕ (HFO) 380 වර්ගයේ තෙල් බෑම් සියයට 14 බැගින් වැඩි වී තිබුණි.

(iii) සමස්ථ තෙල් මෙහෙයුම් කටයුතු 2015 වර්ෂය හා සැසඳීමේ දී, තෙල් පැටවුම් (Lording) මෙට්‍රික් ටොන් 25,403 කින් හෙවත් සියයට 6 කින් ද ගොඩබෑම් (Unloading) මෙට්‍රික් ටොන් 44,980 කින් හෙවත් සියයට 11 කින් ද වර්ධනය වී තිබුණි.

(iv) තෙල් මෙහෙයුම් කටයුතු සඳහා සමාගම සතුව ටැංකි 13 ක් පැවති අතර එයින් එච්එෆ්ඕ (HFO) 380 ගබඩා කරන තෙල් ටැංකි 6 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ එහි උපරිම ධාරිතාව භාවිතා කර තිබූ අවස්ථාද නිරීක්ෂණය විය. 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වර්ෂ 4 ක කාලය තුළ සමස්ත තෙල් ගොඩබෑම් කටයුතු මෙට්‍රික් ටොන් 215,258 කින් හෙවත් සියයට 84 කින් පමණ ක්‍රමිකව වර්ධනය වී තිබූ අතර සාමාන්‍ය වර්ධන වේගය වාර්ෂිකව මෙට්‍රික් ටොන් 71,753 ක් හෙවත් සියයට 28 ක් වී තිබුණි. ඒ අනුව, ඉදිරි වර්ෂය තුළ දී ද නැව් තෙල් ගබඩා කිරීම සඳහා වන ඉල්ලුම තව දුරටත් වර්ධනය වුවහොත් එම ඉල්ලුම සපුරාලිය නොහැකි වේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 5. අභ්‍යන්තර විගණනය

-----------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ, 7.4.1 වගන්තිය හා 2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඞී /55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (1) වගන්තිය අනුව, විගණන කමිටුව රැස් වී අභ්‍යන්තර විගණනයෙන් සොයාගත් කරුණු මත පදනම්ව ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීමට අදාළ නිර්දේශ ලබාදිය යුතු වුවත්, සමාගම අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබූ අතර, අභ්‍යන්තර විගණනයක් සහ විගණන කමිටු රැස්වීම් ද පවත්වා නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

| | **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) | සේවක මණ්ඩල කළමනාකරණය | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර නොගැනීම. |
| (ආ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබීම. |